# භූගෝල විද්‍යාව

## 10 ශ්‍රේණිය

# ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය

එච්. වී. කේ. එන්. ජයවර්ධන
කෑ/ දෙහි/ මානියම්ගම මහා විද්‍යාලය

## නිපුණතාව

භෞතික හා මානුෂ ක්‍රියාවලින්ගේ අන්තර් ක්‍රියා භෞතික හා මානුෂ පරිසරය කෙරෙහි බලපාන ආකාරය පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

## නිපුණතා මට්ටම

ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය, සත්ත්ව පාලනය හා ධීවර කර්මාන්තය විස්තරකර ආර්ථිකය තුළ ඒවායේ වැදගත්කම විමර්ශනය කරයි.

## ඉගෙනුම් පල

- ශ්‍රී ලංකාවේ ප්‍රධාන කෘෂිකාර්මික භෝග වර්ග නම් කරයි.
- ශ්‍රී ලංකාවේ ප්‍රධාන කෘෂිකාර්මික භෝග වර්ගවල ව්‍යාප්තිය ප්‍රදේශ ශ්‍රී ලංකා ආකෘති සිතියමක ළකුණු කර නම් කරයි.
- ප්‍රධාන කෘෂි භෝග ආශ්‍රිත ගැටලු විස්තර කරයි.
- ප්‍රධාන කෘෂි භෝග ආශ්‍රිත ප්‍රවණතා පැහැදිලි කරයි.
- ශ්‍රී ලංකාවේ කිරිපට්ටි පාලනය හා ධීවර කර්මාන්තය ව්‍යාප්ත ප්‍රදේශ ශ්‍රී ලංකා ආකෘති සිතියමක ළකුණු කර නම් කරයි.
- කිරිපට්ටි පාලනය හා ධීවර කර්මාන්තය ආශ්‍රිත ගැටලු ඉදිරිපත් කරයි.
- කිරිපට්ටි පාලනය හා ධීවර කර්මාන්තය ආශ්‍රිත නව ප්‍රවණතා විස්තර කරයි.
- ශ්‍රී ලංකාවේ ආර්ථිකය තුළ කෘෂිකාර්මාන්තයේ ඇති වැදගත්කම පැහැදිලි කරයි.
- ශ්‍රී ලංකාවේ ආර්ථිකය තුළ ධීවර කර්මාන්තයේ ඇති වැදගත්කම පැහැදිලි කරයි.

# ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය

## වී වගාව



- ★ ශ්‍රී ලංකාව අතීතයේ සිටම කෘෂි ආර්ථිකයක් පැවති රටක් ලෙස හැඳින්විය හැකිය.
- ★ මෙරට ප්‍රධාන ආහාර භෝගය ලෙස වී වගාවට ඉතා වැදගත් තැනක් පවතී.
- ★ පුරාණයේ සිට පැවති වී වගාව යටත් විජිත යුගයේදී පරිහානියට පත් වූවද නිදහසින් පසු එය නැවත නගා සිටුවීම සඳහා ගොවි ජනපද පිහිටුවීම, වැව් ප්‍රතිසංස්කරණය යනාදී ක්‍රියාමාර්ග ගෙන ඇත.
- ★ ශ්‍රී ලංකාවේ සෑම ප්‍රදේශයකම වී වගාව ව්‍යාප්තව ඇති අතර ප්‍රමුඛස්ථානයක් ගන්නා ප්‍රදේශ අනුව කලාප 4කි.

| කලාපය | අයත් දිස්ත්‍රික්ක | ලක්ෂණ |
|---|---|---|
| වියලි කලාපය | අනුරාධපුර, අම්පාර<br>පොළොන්නරුව<br>මඩකලපුව, වව්නියාව | බිම් ඒකකයකින් ලබා ගන්නා අස්වනු ප්‍රමාණය වැඩිබැවින් සහල් අතිරික්තයක් නිපදවයි. |
| අතරමැදි කලාපය | කුරුණෑගල<br>බදුල්ල<br>මාතලේ<br>මොණරාගල<br>මාතර | බිම් ඒකකයකින් ලබා ගන්නා අස්වනු ප්‍රමාණය වැඩිය.<br>කුරුණෑගල දිස්ත්‍රික්කය ශ්‍රී ලංකාවේ වැඩිම බිම් ප්‍රමාණයක් වී වගා කරන දිස්ත්‍රික්කයයි. |
| තෙත් කලාපය | ගාල්ල<br>කළුතර<br>කෑගල්ල<br>රත්නපුර, කොළඹ | අස්වනු ප්‍රමාණය වියළි කලාපයට සාපේක්ෂව අඩු වේ.<br>ගංගා මිටියාවත් හා පහත් ප්‍රදේශවල වී වගා කෙරේ. |
| කඳුකර බිම්  | මහනුවර<br>මාතලේ<br>නුවරඑළිය | හෙල්මළු ක්‍රමයට වී වගා කරයි.<br>බිම් ඒකකයකින් ලබා ගන්නා අස්වනු ප්‍රමාණය අඩුය.<br>නුවරඑළිය දිස්ත්‍රික්කය ශ්‍රී ලංකාවේ අඩුම බිම් ප්‍රමාණයක් වී වගා කරන දිස්ත්‍රික්කයයි. |

★ මෙරට වී පරියේෂණ මධ්‍යස්ථාන

බෝඹුවල

මහඉලුක්පල්ලම

බතලේගොඩ

හිඟුරක්ගොඩ

අම්බලන්තොට

**ක්‍රියාකාරකම**

01. මෙරට වී වගාව ව්‍යාප්තියට බලපා ඇති සාධක නම් කරන්න.

02. ලංකාවේ වී පර්යේෂණ ආයතන පිහිටා ඇති ස්ථාන තුනක් නම් කර එමගින් ඉටුවන සේවාවන් ලියන්න.

03. ශ්‍රී ලංකාවේ වී වගා කරන කලාප නම් කර ඒවාට අයත් දිස්ත්‍රික්කයන් වෙන වෙනම ලියන්න.

04. ශ්‍රී ලංකා ආකෘති සිතියමක ඉහත කලාපය හතරට අයත් දිස්ත්‍රික්ක වර්ණ හතරක් භාවිතයෙන් සේයා කර නම් කරන්න.

**තේ වගාව**

★ බ්‍රිතාන්‍ය පාලන සමයේදී ඉංග්‍රීසි ජාතික ජේම්ස් ටේලර් විසින් ශ්‍රී ලංකාවට තේ වගාව හඳුන්වා දෙනු ලැබිණි.

★ ශ්‍රී ලංකාවේ තේ වගා කරන ප්‍රදේශ අනුව ප්‍රදේශ තුනකි.

| උඩරට තේ | මැදරට තේ | පහතරට තේ |
|---|---|---|
| මීටර් 1220ට වැඩි උස් බිම්වල | මීටර් 610 - 1220 දක්වා උස් බිම්වල | මීටර් 610 ට අඩු උස් බිම්වල |
| නුවරඑළිය | මහනුවර<br>මාතලේ<br>බදුල්ල | කළුතර, කෑගල්ල<br>ගාල්ල, හම්බන්තොට<br>මාතර, රත්නපුරය |

★ ශ්‍රී ලංකාවේ විශාල තේ වතු මෙන්ම කුඩා තේ වතු ද ව්‍යාප්තව ඇත.

★ වර්තමානයේ "Ceylon tea" ලෙස සිංහ ළකුණින් වෙළඳපලට හඳුන්වා දෙන ශ්‍රී ලංකා තේ ලොව ඕනෑම රටක පාරිභෝගිකයන්ගේ සිත් දිනා ගැනීමට සමත්ව තිබේ.



**ක්‍රියාකාරකම**

01. පෙළ පොත කියවා පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| ශ්‍රී ලංකාවේ තේ වගාව | | | |
|---|---|---|---|
| අවශ්‍ය පාරිසරික සාධක | වගා කරන ප්‍රදේශ | අපනයනය කරන රටවල් | සංවර්ධනය කිරීම සඳහා පිහිටුවා ඇති ආයතන |
| | | | |

02. ශ්‍රී ලංකාවේ ආර්ථිකයට තේ වගාවෙන් ඇති ප්‍රයෝජන තුනක් ලියන්න.

**පොල් වගාව**





★ දේශීය ජනතාව කප්රුක ලෙස හඳුන්වන පොල් ගස ශ්‍රී ලාංකිකයින්ගේ ජන ජීවිතය හා බැඳුනු සුවිශේෂී ශාකයකි.

★ ශ්‍රී ලංකාවේ පොල් වගාව ව්‍යාප්තව ඇති ප්‍රදේශ,

මහ පොල් ත්‍රිකෝණය (කොළඹ - කුරුණෑගල - හලාවත)

සුළු පොල් ත්‍රිකෝණය (රන්න - මිද්දෙනිය - තංගල්ල)

කොළඹ - තංගල්ල දකුණු වෙරළ තීරය

මඩකලපුව, යාපනය ප්‍රදේශ

ගෙවතු වගාවක් ලෙස දිවයිනේ සෑම ප්‍රදේශයකම

★ පොල් පර්යේෂණ ආයතන

ලුණුවිල, ඇඹිලිපිටිය

★ පොල් වගාව ව්‍යාප්ත වීම කෙරෙහි බලපා ඇති පාරිසරික සාධක

2000 mm - 2500 mm අතර වර්ෂාපතනය

$20^{\circ}C$ -$27^{\circ}C$ අතර සාමාන්‍ය උෂ්ණත්වය

ලවන මිශ්‍ර වැලි පස හා රැලි බිම

★ ශ්‍රී ලංකාවේ පොල් නිෂ්පාදනයෙන් වැඩි කොටසක් දේශීය පරිභෝජනයට යොදා ගැනීම වර්තමානයේ දැකිය හැකි ලක්ෂණයකි.

ක්‍රියාකාරකම

01. හිස්තැන් පුරවන්න

මහ පොල් ත්‍රිකෝණයට ......................., ......................., ....................... යන ප්‍රදේශ අයත් වේ.

සුළු පොල් ත්‍රිකෝණයට අයත් වනුයේ ......................., ......................., ....................... යන ප්‍රදේශයන්ය.

පොල් වගාවේ ව්‍යාප්තිය සඳහා ....................... වර්ෂාපතනයත්, ....................... අතර සාමාන්‍ය උෂ්ණත්වයත් .......................................... වැලි පස හා රැලි බිමත් අවශ්‍ය වේ.

ශ්‍රී ලංකාවේ වගා බිම් ප්‍රමාණයෙන් ....................... ක ප්‍රමාණයන් පොල් වගාව සඳහා යොදා ගෙන ඇත.

02. "පොල් ගස කප්රුකකි" යන මාතෘකාව අනුව පෝස්ටරයක් නිර්මාණය කරන්න.

## රබර් වගාව

★ බ්‍රිතාන්‍ය ජාතික හෙන්රි වික්හැම් විසින් හෙනරත්ගොඩ උද්‍යානයේ මුල්ම රබර් පැළය රෝපණය කර මෙරටට හඳුන්වා දුන් රබර් වගාව වර්තමානයේ අපනයන ආදායම් උපයන මාර්ගයක් මෙන්ම රැකියා සැපයීමේ මාර්ගයක් ලෙසද ඉතා වැදගත් වේ.

| ශ්‍රී ලංකාවේ රබර් වගාව | | |
|---|---|---|
| වැඩි වශයෙන් ව්‍යාප්තව ඇති දිස්ත්‍රික්ක | සුළු වශයෙන් රබර් ව්‍යාප්තව ඇති දිස්ත්‍රික්ක | අලුතින් රබර් වගාව හඳුන්වා දී ඇති දිස්ත්‍රික්ක |
| කෑගල්ල<br>රත්නපුර<br>කළුතර<br>කොළඹ<br>ගම්පහ<br>ගාල්ල | මාතලේ<br>මහනුවර<br>බදුල්ල<br>හම්බන්තොට<br>මොණරාගල | මුලතිව්<br>වව්නියාව |

★ රබර් පර්යේෂණ ආයතනය - අගලවත්ත

★ ශ්‍රී ලංකාවෙන් අපනයනය කරන රටවල්

යුරෝපා සංගමයේ රටවලට (ඔස්ට්‍රියාව, බෙල්ජියම, ප්‍රංශය, ජර්මනිය...)

ඉන්දියාව

චීනය

ජපානය

හොංකොං



**ක්‍රියාකාරකම**

01. රබර් වගාව ලාංකික ජනතාවට වැදගත්වන ආකාරය ලියන්න.

02. රබර් වගාව අලුතින් ව්‍යාප්ත කිරීමට කටයුතු කර ඇති ප්‍රදේශ මොනවාද?

03. රබර් පර්යේෂණ ආයතනය මගින් ඉටුවන සේවාවන් ලියන්න.

04. රබර් වගාවේ ව්‍යාප්තිය කෙරෙහි බලපාන්නා වූ සාධක, පාරිසරික හා වෙනත් සාධක ලෙස වෙන් කර ලියන්න.

05. ශ්‍රී ලංකා ආකෘති සිතියමක රබර් වගා කරන ප්‍රධාන දිස්ත්‍රික්ක එක් වර්ණයකින්ද මෑත කාලීනව ව්‍යාප්ත කරන ලද දිස්ත්‍රික්ක තවත් වර්ණයකින්ද සේයා කර නම් කරන්න.

## සුළු අපනයන භෝග

සුළු අපනයන භෝග යනු, සාම්ප්‍රදායික අපනයනයන්ට අමතරව අපනයනය සඳහා කුඩා පරිමාණයෙන් වගා කරන කෘෂිකාර්මික භෝගයන්ය.

උදාහරණ

ගම්මිරිස්
කෝපි
සාදික්කා
කොකෝවා
කුරුඳු



සුළු අපනයන භෝග පිළිබඳ කටයුතු කිරීම සඳහා පිහිටුවි ඇති ආයතන

සුළු අපනයන භෝග දෙපාර්තමේන්තුව
සුළු අපනයන මණ්ඩලය
සුළු අපනයන භෝග පර්යේෂණ ආයතනය - මාතලේ

★ 60 දශකයේ පමණ සිට ශ්‍රී ලංකා රජය විසින් විශේෂ අවධානය යොමු කරනු ලැබූ සුළු අපනයන භෝග දේශීය ජනතාවගේ ආදායම වැඩි කර ගැනීමටත්, නව රැකියා බිහිවන මාර්ගයක් ලෙසත්, ලෝක වෙළඳපලෙහි අධික ඉල්ලුමත්, අතුරු වගා ලෙස වගා කළ හැකි නිසාත් වර්තමානයේ බොහෝ ජනප්‍රිය වී ඇත.

**ක්‍රියාකාරකම**

01. සුළු අපනයන භෝග යනු මොනවාද? සුළු අපනයන භෝග සඳහා උදාහරණ පහක් ලියන්න.

02. ශ්‍රී ලංකාවේ සුළු අපනයන භෝග වගාවන් සංවර්ධනය සඳහා පිහිටුවා ඇති ආයතන නම් කර ඒවායෙන් ඉටුවන මෙහෙය සඳහන් කරන්න.

03.දේශීය ජනතාවගේ ආර්ථිකය නඟා සිටුවීම සඳහා සුළු අපනයන භෝග වගාව ඉතා යහපත් පිළියමකි. මෙම කියමන හේතු දක්වමින් පැහැදිලි කරන්න.

## එළවළු හා පලතුරු

- ★ සෞඛ්‍ය සම්පන්න ජීවිතයකට එළවළු හා පලතුරු අත්‍යවශ්‍ය වේ.
- ★ ශ්‍රී ලංකාවේ කවර පළාතක වුවද පලතුරු වගා කළ හැකි අතර එළවළු සඳහා විශේෂිත කලාප හඳුනාගෙන ඇත.

  වියළි කලාපය ⟶ මුරුංගා, වට්ටක්කා, කැකිරි, තක්කාලි, මෑ කරල්, වම්බටු .....

  තෙත් කලාපය ⟶ බණ්ඩක්කා, මෑ කරල්, පතෝල

  කඳුරට කලාපය ⟶ ලීක්ස්, ගෝවා, බෝංචි, කැරට්, අර්තාපල් .....

- ★ පළතුරු සඳහා දේශීය හා විදේශීය වෙළඳපල පවතී. නැවුම් පලතුරු ලෙස මෙන්ම කැබලි හා පෙති ලෙසද විජලනය කිරීමෙන්ද පලතුරු විදේශීය වෙලඳපලට නිකුත් කෙරේ.

**ක්‍රියාකාරකම**

01. ව්‍යාපාරික මට්ටමින් එළවළු වගා කරන දිස්ත්‍රික්ක නම් කරන්න.

02. වියළි, තෙත්, කඳුරට කලාපයට අයත් එළවළු ඇතුලත් කර වගුවක් සකසන්න.

03. ව්‍යාපාර මට්ටමින් වගා කරන පලතුරු නම් කරන්න.

04. "දේශීය එළවළු හා පලතුරු වගාව හා ඒ ආශ්‍රිත කර්මාන්ත නංවාලීම රැකියා හිඟයට පිලියමකි" මෙම කියමන පැහැදිලි කරන්න.



## සත්ත්ව පාලනය හා කිරිපට්ටි පාලනය

★ මෙරට සත්ත්ව පාලනය කෙරෙහි අවධානය යොමු වීමට හේතු ඃ-

ජනතාවගේ පෝෂණ මට්ටම ඉහළ නැංවීම

ග්‍රාමීය ජනතාවට රැකියා ලබා දීම

ගොවි ජනතාවට අතිරේක ආදායම් මාර්ග සලසා දීම

කෘෂිකර්මාන්තයට අවශ්‍ය පොහොර සපයා දීම

| කිරිපට්ටි පාලනය | | | |
|---|---|---|---|
| අවශ්‍යතාව | දිස්ත්‍රික්ක | පර්යේෂණ මධ්‍යස්ථාන | නිෂ්පාදන |
| ශ්‍රී ලාංකීය ජනතාවගේ පෝෂණ මට්ටම ඉහළ නැංවීම<br>ආනයනික කිරිපිටි සඳහා වැයවෙන විදේශ විනිමය ඉතිරිකර ගැනීම | නුවරඑළිය<br>බදුල්ල<br>පොළොන්නරුව<br>හම්බන්තොට<br>අම්පාර<br>අනුරාධපුරය | අඹේවෙල<br>කනන්විල<br>වල්පිට<br>මීවනපලාන<br>(කිරි ගව සම්පත් මධ්‍යස්ථානය) | කිරිපිටි<br>දියර කිරි<br>චීස්<br>යෝගට්<br>ගිතෙල්<br>අයිස්ක්‍රීම් |



**ක්‍රියාකාරකම**

01. කිරිපට්ටි පාලනය දියුණු කිරීමෙන් මෙරට ජනතාවට ලැබෙන ප්‍රයෝජන පහක් ලියා එකක් පැහැදිලි කරන්න.

02. ශ්‍රී ලංකා ආකෘති සිතියමක කිරිපට්ටි පාලනය සිදුකරන දිස්ත්‍රික්ක වර්ණගන්වා නම් කරන්න.

## ධීවර කර්මාන්තය

★ ශ්‍රී ලංකා ආර්ථිකයේ ඉතා වැදගත් අංගයක් ලෙස ධීවර කර්මාන්තය කැපී පෙනේ.

★ ශ්‍රී ලංකාව සාගරයෙන් වටවූ දූපතක් වීම, දිගු වෙරළ තීරය, පුළුල් මහද්වීපික තටකය, බොකු, කළපු, ස්වාභාවික වරායන් පිහිටීම් ආදී හිතකර සාධක රැසක් ඒ සඳහා සුවිශේෂ වී ඇත.





### ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය

- කරදිය
  - වෙරළාසන්න
    - සාලයා
    - හුරුල්ලා
    - ගල් මාළු
  - ගැඹුරු මුහුදේ
    - තලපත්
    - තෝරා
    - කෝරා
- මිරිදිය
  - ලූලා
  - මගුරා
  - කොරලි
- කිවුල්දිය
  - ඉස්සන්
  - කකුළුවන්

**ක්‍රියාකාරකම**

01. ධීවර කර්මාන්තය සඳහා ශ්‍රී ලංකාවේ දක්නට ඇති හිතකර සාධක තුනක් ලියන්න.

02. ශ්‍රී ලංකාවේ වෙරළාසන්න ධීවර කර්මාන්තය බහුල ලෙස ව්‍යාප්ත වී ඇති කලාප දෙක නම් කරන්න.

03. වෙරළාසන්න කලාපයේ මසුන් බහුල වීමට හේතු මොනවාද?

## ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය ආශ්‍රිත ගැටලු හා ප්‍රවණතා

★ ශ්‍රී ලංකාව තුළ කෘෂිකර්මාන්තය ආශ්‍රිතව පැන නැගී ඇති ගැටලු ප්‍රධාන වශයෙන් ක්ෂේත්‍ර හතරක් ඔස්සේ දැකගත හැකිය.

1. භූමි පරිභෝගය ආශ්‍රිත ගැටලු
2. නිෂ්පාදනය ආශ්‍රිත ගැටලු
3. වෙළෙඳාම සම්බන්ධ ගැටලු
4. පාරිසරික ගැටලු

★ මෙරට කෘෂිකර්මාන්තයේ ප්‍රවණතාද ක්ෂේත්‍ර කිහිපයක් ඔස්සේ සාකච්ඡා කළ හැකිය

1. නිෂ්පාදනය ආශ්‍රිත ප්‍රවණතා
2. තාක්ෂණය ආශ්‍රිත ප්‍රවණතා
3. වෙළෙඳාම ආශ්‍රිත ප්‍රවණතා
4. රාජ්‍ය අනුග්‍රහය

**ක්‍රියාකාරකම**

01. මෙරට කෘෂිකර්මාන්තයේ පහත සඳහන් භෝග සඳහා පැනනැගී ඇති ගැටලු වගුගත කරන්න.

| භෝගය | භූමි පරිභෝගය ආශ්‍රිත ගැටලු | නිෂ්පාදනය ආශ්‍රිත ගැටලු | වෙළෙඳාම සම්බන්ධ ගැටලු | පාරිසරික ගැටලු |
|---|---|---|---|---|
| වී වගාව | | | | |
| තේ වගාව | | | | |
| රබර් වගාව | | | | |
| පොල් වගාව | | | | |
| සුළු අපනයන භෝග | | | | |

02. ධීවර කර්මාන්තය, සත්ත්ව පාලනය යනාදියෙහි යොදාගෙන ඇති නව තාක්ෂණික ප්‍රවණතා උදාහරණ සහිතව දක්වන්න.

03. ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය සඳහා රාජ්‍ය අනුග්‍රහය ලබා දෙන ආකාර පැහැදිලි කරන්න.

## ශ්‍රී ලංකා ආර්ථිකය තුළ කෘෂිකර්මාන්තයේ වැදගත්කම

- ★ මෙරට කෘෂි අංශය මගින් දළ දේශීය නිෂ්පාදනයට 11.1%ක දායකත්වයක් සැපයේ.
- ★ අපනයන ආදායමෙන් 23% ක් කෘෂි අංශයෙන් ඉපැයේ.
- ★ ශ්‍රම බලකායෙන් 31% ක් කෘෂි අංශයේ රැකියාවල නියුතු වේ.
- ★ ආහාර නිෂ්පාදන මෙන්ම කර්මාන්ත රැසකට අමුද්‍රව්‍ය සැපයේ.
- ★ මෙරටට නව රැකියා රැසක් බිහිකරගත හැකි ක්ෂේත්‍රයකි.



**ක්‍රියාකාරකම**

01. ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය මගින් දළ දේශීය නිෂ්පාදනයට වැඩිම දායකත්වයක් ලබා දෙන්නේ කුමන අංශය මගින්ද?

02. කෘෂිකර්මාන්තය ශ්‍රම බලකායට රැකියා සැපයීම මගින් දක්වන දායකත්වය උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

03. ශ්‍රී ලංකාවේ කෘෂි අංශය ආශ්‍රිතව ශ්‍රම බලකාය අඩු වීමට බලපා ඇති හේතු තුනක් ලියා එම තත්ත්වය මග හරවා ගැනීමට යෝජනා ඉදිරිපත් කරන්න.